ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

මගේ අංකය / எனது இல. / My Ref. CSS/8/1/62/2020 ඔබේ අංකය / உனது இல / Your Ref. දිනය / திகதி / Date 2020.10. 13

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (අයවැය) 02/2020**

දකුණු පළාත් සභාවේ සියළුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්,
ගණන්දීමේ නිළධාරීන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් වෙත.

**<u>දකුණු පළාත් සභාව තුල වියදම් කළමනාකරණය කිරීම</u>**

දකුණු පළාත් සභාවේ 2020 මුදල් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ප්‍රතිපාදන සීමාව අනුව,2020 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළියෙල කරන ලදි.

02. මධ්‍යම රජයේ අයවැය ලේඛනයක් ප්‍රකාශයට පත් නොවීම මත 2020 වර්ෂය සඳහා අදියර 03ක් යටතේ අතුරු සම්මත ගිණුම් මගින් දකුණු පළාත් සභාව වෙත පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් සාමූහික ප්‍රතිපාදනයන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් වරින් වර ප්‍රකාශයට පත් කරන ලදි.

ඒ අනුව, 2020 මුදල් ප්‍රකාශය මගින් වෙන් කරන ලද සමස්ථ ඇස්තමේන්තුගත හා පුනරාවර්තන ප්‍රතිපාදනයන් උපමාන පාදක හා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වෙනුවෙන් අතුරු සම්මත ගිණුම් මගින් වරින් වර වෙන්කර දී ඇති ප්‍රතිපාදන හා පළාතේ ආදායම සැළකිල්ලට ගනිමින් ආයතනික මූලධන වියදම් වෙනුවෙන් ඔබ වෙත ප්‍රතිපාදන වෙන් කර දී ඇත.

රාජ්‍යය ප්‍රතිපත්තියක් ලෙස ජාතිය ගොඩනැගීමේ බදු අහෝසි කිරීමට ගත් තීරණය හා කොරෝනා ව්‍යවසන තත්වය මත රටේ උද්ගත වී ඇති වාතාවරණය තුල පළාත් සභාවේ අපේක්ෂිත ආදායම නොලැබී යාම නිසා 2020 වර්ෂයේ මුදල් ප්‍රකාශය මගින් වෙන් කර දෙන ලද ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් මූල්‍යකරණය කර ගැනීමේ ගැටළුවක් පැන නැගී ඇත.

03.ඒ අනුව, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලබා දී ඇති පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන අරපිරිමැස්මෙන් හා උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීව උපයෝජනය කිරීම පිණිස බලධාරීන් විසින් සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතු අතර, වියදම් කළමණාකරණය කිරීම සඳහා පහත උපදෙස් අනුව කටයුතු කල යුතු බව අවධාරණය කරමි.

- විශේෂ අවස්ථාවකදී හැර පරිපූරක ඇස්තමේන්තු මගින් අතිරේක ප්‍රතිපාදන ලබාදීම මෙම වර්ෂයේ දී සිදු නොකරන අතර ,ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා ගණන් දීමේ නිලධාරීන් ස්වකීය වැය ශීර්ෂය යටතේ වන වියදම් සම්බන්ධයෙන් මනා පාලනයක් පවත්වා ගත යුතුය.

- එසේම අත්‍යාවශ්‍ය හා අනපේක්ෂිත වියදම් සඳහා හැර වෙනත් කරුණු සඳහා වන අතිරේක ප්‍රතිපාදන සඳහා කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.එබැවින්, පවතිනා ප්‍රතිපාදන සීමාව තුල වියදම් කලමනාකරණය කරගැනීමට කටයුතු කල යුතු අතර ප්‍රතිපාදන සීමාව ඉක්මවා ඇති කරගනු ලබන බැඳීම් සඳහා පළාත් භාණ්ඩාගාරය වගකීම් භාර ගනු නොලැබේ.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 කාර්යාලය / காரியாலயம் / Office 091 4119010 091 2226118 ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

- වැටුප් හා දීමනා හැර අනෙකුත් පුනරාවර්ථන ප්‍රතිපාදන වලින් 10%ක් අවුරා තැබීමට කටයුතු කල යුතු වේ.

- අවුරා තැබීමට සලකා බලන ලද වැය විෂයයන් යටතේ ඇති ප්‍රතිපාදන වල ඉදිරියේදී ඇතිවන ඌනතාවයන් වෙනුවෙන් මුදල් රීති 30 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් වලට ඉඩ දිය නොහැකි බැවින්, අවුරා තැබීම් සලකා බැලීමේදී අරපිරිමැස්මෙන් කටයුතු කරමින් මනාව වියදම් කලමනාකරණය කර ගැනීමට ආයතනික වැඩපිළිවෙලක් සකස් කරගැනීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ හා ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීම වේ.

- අත්‍යාවශ්‍ය වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හිදී මුදල් රීති 30 යටතේ මාරු කිරීම් සඳහා පළාත් භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

- **ආයතනික මූලධන වියදම් දැරීම සඳහා වෙන් කර දී ඇති ප්‍රතිපාදන සීමාව තුල වියදම් කළමනාකරණය කර ගත යුතු අතර වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රාග්ධන ප්‍රතිපාදනය අදාල කර නොගත යුතුය.**ප්‍රතිපාදන සීමාව ඉක්මවා කිසිදු බැඳීමක් ඇතිකර නොගත යුතුය. එසේම, ප්‍රාග්ධන ඇස්තමේන්තු සංශෝධනය කර ඇති බැවින්, මුදල් රීති 30 යටතේ ප්‍රතිපාදන මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

- අතුරු සම්මත ගිණුම් යටතේ උපමාන පාදක ප්‍රදාන හා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සඳහා වෙන් කර දී ඇති ප්‍රතිපාදන සීමාව තුල වියදම් කලමනාකරණය කර ගත යුතුය.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ පවතින ප්‍රාග්ධන ස්වරූපයේ නඩත්තු සඳහා මුදල් ප්‍රකාශයේ ප්‍රතිපාදන වෙන් කලද, අත්‍යාවශ්‍ය කරුණකදී හැර සමස්ථ ප්‍රතිපාදනය සඳහා බැඳීම් ඇතිකර නොගත යුතුය.

- විශේෂ අත්තිකාරම් හා උත්සව අත්තිකාරම් වාරික සියල්ල මෙම වර්ෂය තුලදී අයකර ගැනීමට කටයුතු කල යුතු අතර, ආපදා ණය සඳහා අග්‍රිම ලබා දීම සීමා කිරීම හේතුවෙන් අත්තිකාරම් ගිණුමේ හර හා බැර සීමාවන් සංශෝධනය කිරීමට අවශ්‍ය වන්නේ නම් මුදල් රීති 369 ප්‍රකාරව, සීමා සංශෝධනය සඳහා වන ඉල්ලීම් නියමිත ආකෘතිය අනුව සකස් කර 2020.11.30 දිනට පෙර මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.

2020 වර්ෂය සඳහා දකුණු පළාත් සභාව තුල වියදම් කලමනාකරණය කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (අයවැය) 01/2020 මඟින් ලබා දී ඇති අනෙකුත් උපදෙස් වල වෙනසක් සිදු නොවන බවද දන්වා සිටිමි.

ආර්.සි. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත්

01. ආණ්ඩුකාර ලේකම්, දකුණු පළාත - කරු. ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීම සඳහා
02. ලේකම්,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ. ගැ. ස.
03. ලේකම්, මුදල් කොමිෂන් සභාව - කරු. දැ. ගැ. ස.
04. සහකාර විගණකාධිපති, විගණන උප කාර්යාලය,ගාල්ල - කරු. දැ. ගැ. ස.
05. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත- කරු. දැ. ගැ. ස.
06. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත- කරු. දැ. ගැ. ස.
07. මුදල් අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත- කරු. දැ. ගැ. ස.
08. ගණකාධිකාරී ගෙවීම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත- කරු. දැ. ගැ. ස.